# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

# இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

## වෙළඳ අමාත්‍යාංශය

# ජාතික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම 2021

## ශ්‍රී ලාංකික ව්‍යවසායකයන්ගේ දේශීය සන්නාම විදේශීය වෙළඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීමේ ජාතික අපනයන සන්නාම සංවර්ධන වැඩසටහන 2021 - 2024

රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්තියට අනුකූලව දේශීය ව්‍යවසායකයන් ශක්තිමත් කිරීමට සහ ගෝලීය නවෝත්පාදක කේන්ද්‍රයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථාපිත කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික සෞභාග්‍යය සාක්ෂාත් කර ගැනීමේ වැදගත් සංවර්ධන උපාය මාර්ගයන් ලෙස හඳුනාගෙන ඇත.

වත්මන් කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ විදේශ විනිමය ඉපයීම වැඩි කිරීම මගින් දේශීය ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා ශක්තිමත් අපනයන අංශයක් ගොඩනගාගත යුතු වේ. වත්මන් වාණිජ නව සාමාන්‍යකරණය තුළ විවිධාංගීකරණය වූ සහ අගය එකතු කරන ලද භාණ්ඩ හා සේවා සඳහා ශක්තිමත් දේශීය සන්නාම ගොඩනැගීම තීරණාත්මක සාධකයක් වනු ඇත.

එහෙයින්, ශ්‍රී ලාංකීය ව්‍යවසායකයන්ට තම දේශීය සන්නාමයන් විදේශීය වෙළඳපොළ තුළ සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීමට මූල්‍යමය සහන ලබා දීම සඳහා මෙම ජාතික අපනයන සන්නාම සංවර්ධන වැඩසටහන සකසා ඇත.

මෙම වැඩසටහන මගින් ශ්‍රී ලාංකික ව්‍යවසායකයන්ව නිර්මාණශීලී, නවෝත්පාදිත සහ ඉහළ අගය එකතු කිරීමක් සහිත නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීමට අපේක්ෂා කරයි. 100% ශ්‍රී ලාංකික හිමිකාරිත්වය සහිත සන්නාම වලට පමණක් මෙම යෝජනා ක්‍රමය අදාළ වේ.

### යෝජිත සහය

**කාණ්ඩ 1 - ස්ථාපිත අපනයන සමාගම් :**

ස්ථාපිත සන්නාමයක් සහ ජාත්‍යන්තර වෙළඳපොළ සන්නාමකරණය පිළිබඳ පූර්ව පළපුරුද්ද සහිත ස්ථාපිත සැපයුම් දමයක් හා ප්‍රමාණවත් යටිතල පහසුකම් සහිත අපනයනකරුවන් මේ සඳහා සුදුසුකම් ලබයි. එමෙන්ම වසර 3 කට වැඩි අපනයන පළපුරුද්දක් තිබීම අනිවාර්ය වේ. 50% ක් ලෙස පිරිවැය බෙදාගැනීමේ පදනම මත හා වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත වසරකට රු. මිලියන 10.0 බැගින් වූ උපරිමයකට යටත්ව වසර 03 ක් සඳහා මෙම සහය ලබාදීමට සලකා බැලේ.

**කාණ්ඩ 11 - අපනයනය සඳහා සූදානම් සමාගම් :**

ශක්තිමත් දේශීය සන්නාමයක්, දේශීය සැපයුම් දමයක්, ප්‍රමාණවත් සම්පත් සහ යටිතල පහසුකම් සහිත අපනයන වෙළඳපොළට පිවිසීමට කැපවීමක් ඇති සමාගම් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. 50% ක් ලෙස පිරිවැය බෙදාගැනීමේ හා වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත වසරකට රු. මිලියන 5.0 බැගින් වූ උපරිමයකට යටත්ව වසර 03 ක් සඳහා මෙම සහන ලබා දීමට සලකා බැලේ.

වැඩි විස්තර සඳහා යෝජනා ක්‍රමයේ මාර්ගෝපදේශය බලන්න

### අයදුම් කිරීමේ ක්‍රමය

අයදුම්පත් සමග යෝජනා ක්‍රමයේ මාර්ගෝපදේශය අපනයන සංවර්ධන මණ්ඩලයේ www.srilankabusiness.com යන වෙබ් අඩවියේ "Announcement" යටතේ බාගත කළ හැකිය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, යෝජනා ක්‍රමයේ මාර්ගෝපදේශවල නියම කර ඇති අදාළ ලිපිලේඛන සමග **2021 අගෝස්තු 13 වන සිකුරාදට** හෝ ඉන් පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ – වෙළඳපොළ සංවර්ධන, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, නවම් මාවත, කොළඹ 02 යන ලිපිනයට තැපෑලෙන් ද, අදාළ ලිපි ලේඛන සහිතව සම්පූර්ණ කරන ලද අයදුම්පත් pras@edb.gov.lk සහ dinushika@edb.gov.lk වෙත ඊමේල් මගින් ද එවිය යුතුය.

වැඩි විස්තර සඳහා වෙළඳපොළ සංවර්ධන අංශයේ ප්‍රසන්න ජයසිංහ මයා නියෝජ්‍ය අධ්‍යක්ෂ / වෙළඳපොළ සංවර්ධන දු.ක. 0112300722, ජංගම දු.ක. 0176850217, විද්යුත් තැපැල pras@edb.gov.lk හෝ දිනුෂිකා අබේගුණවර්ධන මිය සහකාර අධ්‍යක්ෂ / වෙළඳපොළ සංවර්ධන ජංගම දු.ක. 0776130050, විද්යුත් තැපැල dinushika@edb.gov.lk. අමතන්න.


**සභාපති සහ ප්‍රධාන විධායක**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**

**අංක 42, නවම් මාවත, කොළඹ 02.**

**දුරකථන : 0112300705-11 ෆැක්ස් : 0112300715**

**www.srilankabusiness.com**